# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,100 — 1920ක්වූ අප්‍රෙල් මස 23වෙනි දිනවූ සිකුරාද.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාධිගනීති.

වර්ෂ 1920සේ නොම්මර 3ගේ ආඥාපණතෙන් වෙනස්කරණලද වර්ෂ 1901කේ නොම්මර 25 දරණ ආඥාපණතේ 5වෙනි වගන්තියට අනුකූලව නුවරඑළියේ නගරාභිවෘද්ධික සභාව විසින් සාදනලද මෙහි පහත සඳහන් අතුරුපණත පොදුජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධකරන්ට යෙදුනා ඇත. වර්ෂ 1920ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින නොම්මර 5,880 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරන්ට යෙදුන නොම්මර 1කේ අතුරුපණත මෙයින් අවලංගුය.

උතුමාණන්වහන්සේගේ අණපරිදී,

වර්ෂ 1920ක්වූ අප්‍රෙල් මස 10වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

### ඉහතකී අතුරුපණත.

නුවරඑළියේ නගරාභිවෘද්ධික සභාවේ මායිම්තුළ සිටින එක එක බල්ලාට රුපියල් 5 ගණනේ ලියාපදිංචිකිරීමේ ගාස්තුවක් අයකරණු ලැබේ. මෙම ගාස්තුව එක එක අවුරුද්දේ මාර්තු මාසේ 31වෙනි දිනට මත්තෙන් ගෙවිය යුතුය.

ගතවන අවුරුද්දට ලියාපදිංචිකිරීමේ ගාස්තුව යම් බල්ලෙක් වෙනුවෙන් වෙන ස්ථානයකදී ගෙවා තිබෙනවාය කියා උප ඒජන්ත උන්නාන්සේට ඒත්තුයන අන්දමට ඔප්පුකළොත් ඒ බල්ලා වෙනුවෙන් ගාස්තුව අයකරණු නොලැබේ.

### ඉඩම් විකිණීම්.

**No. 2,096, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ ජූනි මස 9වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම, හුරුළු සහ කලාගම් පලාත්වල පිහිටා තිබෙන බිම්කැබලි 17ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම 95. ගම—කඩවත්කෝරළේ කඩවත්ගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 1X | කඩවත්ගමකැලේ නොහොත්පලුගහඉඩම | කඩවත්ගම මැනික්රාල වෙල්විදානේ සහ තවත් අය | වියට සුදුසු කැලේ .. | 2 | 3 | 36 | 31 |
| 1AB | කඩවත්ගමකැලේ නොහොත් මකෝන්ගහඉඩම | කඩවත්ගම කේ. පුංචිරාල .. | කැලේ .. | 1 | 3 | 13 | 31 |
| 1AE | එම .. | එම .. .. | එම .. | 0 | 1 | 23 | 31 |
| 1AI | කඩවත්ගමවෙල .. | — .. .. | කේ. අප්පුරාල සහ තවත් අය විසින් අල්ලාගත් කුඹුර | 0 | 0 | 11 | 31 |
| | සිතියම 301. ගම—නුවරගම්කෝරළේ ගම්බිරිගස්වැව. | | | | | | |
| 9R | ගම්බිරිගස්වැවකැලේ .. | ගම්බිරිගස්වැවේ ජී. බී. බයියා වෙල්විදානේ | මූකලාන සහ කැලේ .. | 3 | 0 | 13 | 26 |
| | සිතියම 361. ගම—එප්පාවලකෝරළේ නල්ලච්චිය. | | | | | | |
| 1C | නල්ලච්චියකැලේ .. | — .. .. | කැලේ .. | 2 | 2 | 38 | 36 |
| 1C2 | එම .. | නල්ලච්චියේ පී. ඇම්. හේරත්හාමි ආරච්චිල සහ තවත් අය | එම .. | 1 | 0 | 8 | 36 |
| | සිතියම 529. ගම—එප්පාවලකෝරළේ සන්ගව්ටෑව. | | | | | | |
| 24L | සන්ගව්ටෑවකැලේ .. | සන්ගව්ටෑවේ රාජකීර්ති ඩිංගිරි බන්ඩා වෙල්විදානේ සහ තවත් අය | වියට සුදුසු කැලේ .. | 4 | 3 | 16 | 31* |
| 24N | අක්කරවෙල .. | — .. .. | සන්ගව්ටෑවේ පී. වන්නිහාමි විසින් අල්ලාගත් කුඹුර | 0 | 0 | 36 | 22* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| සිතියම 599. ගම—කැඳුකෝරලේ පිංනාගම. | | | | | |
| 20 | මොරගහමුකලාන | පිංනාගම පී. උක්කුවා | මූකලාන | 4 0 20 | 18† |
| 26G | මහකඩියාවකැලේ | දිවුල්වැවේ කේ. කන්දුගේ මදූර් | අත්දඹුවා කැලේ | 2 3 34 | 17·50† |
| මුල් සිතියම 5,374. ගම—උතුරු කලාගම්කෝරලේ අලහපෙරුමාගම. | | | | | |
| 1 | වීරගහඉඩම | — | කැලේ | 2 3 17 | 21†‡ |
| 2 | එම | අලහපෙරුමගම ඒ. ඇල්. හබිබුලෙබ්බෙ | එම | 3 1 16 | 21†‡ |
| 4 | එම | එම | එම | 2 1 26 | 21†‡ |
| සිතියම 5,380. ගම—උලගල්ලකෝරලේ පඩිකෙටුවැව. | | | | | |
| 8 | මහවෙලලහකැලේ | — | වියට සුදුසු කැලේ | 0 1 0 | 16 |
| සිතියම 5,011. ගම—කුන්චිට්ටුකෝරලේ අසියතිගැවැව. | | | | | |
| 1 | දඹගහඉඩම | අසියතිගැවැවේ ඇස්. නාසිදු | කැලේ | 1 3 33 | 26 |
| 2 | එම | අසියතිගැවැවේ උක්කුවාගේ පුස්සා | එම | 4 3 27 | 18·50 |

* මෙම ඉඩම් කලාවැව යෝදයාඇල යටතේ වතුර ගතහැකි ඉඩම්ය. එය විකුනන්නේ එහි ගැනුම්කාරයින් හෝ ඔවුන්ගේ උරුමක්කාර ගැනුම්කාරදීන් ආණ්ඩුව විසින් මින්මත්තට නියමකරන්ට යෙදෙන දිය බද්දක් ගෙවන කොන්දේසිය පිටය, දැනට මෙම ඉඩම්වලට අක්කරයකට අවුරුද්දකට රුපියල් දෙක බැගින් බදුගෙවීමට යටත්ය.

† මෙම ඉඩම් මීට ප්‍රතම විකුණාතිබේ, නමුත් ඒවා නැවතත් විකිනීමට ප්‍රසිඛකරනු ලබන්නේ ගැනුම්කාරදීන් විසින් විකිණීමේ කොන්දේසි සම්පූර්ණනොකල නිසාය.

‡ මෙම ඉඩම් විකුණන්නේ ඒවාට යම් කලකදී වතුර ගතහැකිවුනොත් ආණ්ඩුකාර උතුමානන් විසින් නියමකරණ බද්දක් එකලට අයිතිකාරයින් විසින් ගෙවන කොන්දේසිපිටය.

මෙමඉඩම් ගැන වැඩිදුර කාරණ උතුරු මධ්‍යමදිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 17වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඉඹුල්ගොඩ ගැහුලමසින්ට පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රි සභාවේ මන්ත්‍රණයඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 17,144. ගම—පහලඉඹුල්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලගහවත්ත | පොල්ගස් 13ක් තිබේ | ගුරුන්නාන්සෙලාගේ දොනා සෙදොනා සහ තව අය | 0 3 13·9 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1920ක්වූ මැයි මස 24වෙනි දින උදේ 10ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 19වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ප්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගම්පහ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රි සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 17,155. ගම—ගම්පහ මැදගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෝන්ගහවත්ත | පොල්ගස් 7ක්ද, පැලක්ද, අතු සෙවිල්ලපු ගෙයකින් කොටසක්ද තිබේ | රජපක්ෂආච්චිගේ පොඩිසිඤ්ඤෝ | 0 0 16·4 |
| 2 | එම | පොල්ගස් 13ක් තිබේ | ජේ. සී. රණතුංග | 0 0 21·6 |
| 3 | සිරිසුරදරුව | පොල්ගස් 9ක්ද කොස්ගස් 4ක්ද අතුසෙවිල්ලපු ගෙයකින් කොටසක්ද තිබේ | ඩී. ඇස්. ප්‍රේමරත්න සහ තවඅය | 0 0 11·4 |
| 4 | කෝන්ගහවත්ත | පොල්ගස් 127ක් තිබේ | ඩී. ජේ. ඒ. ජයවර්ධන | 1 1 17·3 |
| 5 | කහටගහවත්ත | පොල්ගස් 55ක් තිබේ | කේ. ඔ. හෙරස්සිඤ්ඤෝ සහ තවඅය | 0 2 23·3 |
| 6 | කෝන්ගහවත්ත | පොල්ගස් 1ක් තිබේ | මහවිතානලාගේ විලියම්සිඤ්ඤෝ | 0 0 2·8 |
| 7 | එම | පොල්ගස් 3ක් තිබේ | කේ. ඔ. හෙරස්සිඤ්ඤෝ සහ තවඅය | 0 0 6 |
| 8 | එම | පොල්ගස් 12ක්ද මඩුවකින් කොටසක්ද තිබේ | කේ. සයිමන් සිඤ්ඤෝ | 0 0 20 |
| 9 | එම | පොල්ගස් 26ක්ද, කොස්ගස් 2ක්ද තිබේ | ඇස්. පී. සාමිච්චි අප්පු | 0 1 5·4 |
| 10 | එම | පොල්ගස් 4ක්ද, කොස්ගහක්ද තිබේ | ජේ. සුබෝහාමි | 0 0 10.6 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1920ක්වූ මැයි මස 24වෙනි දින දවල් 12ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 20වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ප්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මල්වානේ ගැණු ලමයින්ට සහ පිරිමිලමයින්ට පාඨශාලාවල් දෙකක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 17,162. ගම—මල්වාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වැවලගවත්ත .. | පොල්ගස් 59ක් සහ සෙතෝලයක් තිබේ .. | ඩබ්ලිව්. පී. පී. විජේරත්න .. | 0 2 20 |
| 2 | කුරුඳුවත්ත .. | පොල්ගස් 55ක් තිබේ .. .. | සෙනෙවිරත්න මුදලිතැන සහ තව අය | 0 3 30·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ මැයි මස 24වෙනි දින උදේ 11·30හේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ අප්‍රේල් මස 20වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රත්නපුරේ ලෝකල්බෝර්ඩ් කුලීකාරයින්ගේ ලැසිමට වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 2,949. ගම—රත්නපුරේ වවුම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හෝම්පේලකනත්ත ... | එලවළුකොටුව .. | යූ. මල්හාමි සහ තවත් අය .. | 0 0 13·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ මැයි මස 18වෙනි දින පස්වරු 1කේ කනිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ අප්‍රේල් මස 14වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ජී. ඇෆ්. ආර්. බ්‍රවුනිං,
සබරගමුවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[ගාල්ල දැන්වීම නො. 7,527.]

වර්‍ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවිලූත් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ෆ්‍රෙඩරික් එවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රාජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ෆ්‍රෙඩරික් එවිස්,
විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

### ඉඩම්වල තොරතුරු.

දකුනු දිසාවේ ගාළු දිස්ත්‍රික්කේ ගහබොඩපත්තුවේ ගෝනදෙනිය යන ගම පිහිටා තිබෙන මීට අමුණුනා සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මුල් සිතියම 527.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 5 .. | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | .. | .. | .. | 0 0 13 |
| 38 .. | එම | .. | .. | .. | 0 0 20 |
| 39 .. | එම | .. | .. | .. | 0 0 16 |
| | | | | | 0 1 9 |

මීට මායිම්—උතුරට ගාල්ලේ හිට උඩුගමට යන පාරද, 255,467 සහ 253,425 යන පිඹුරුකඩදාසිවල පේන ඉඩම්ද; නැගෙණහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රාජසන්තක හැටියට ප්‍රසිඩකරපු දූන්ගල ලඟ ගොඩකන්දද; දකුණට 117,738 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද, ඇලක්ද, (117,738 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) 117,738 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; බස්නාහිරට 117,738 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද.

II.—ලංකාමැනීමේ මුල් සිතියම 527.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 30 .. | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | .. | .. | .. | 0 0 4 |

මීට මායිම්—උතුරට සහ නැගෙණහිරට 107,329 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; දකුණට උඩුගම හිට ගාල්ලට යන පාරද; බස්නාහිරට උඩුගම හිට ගාල්ලට යන පාරද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ උඩලමත්තේගමගේ විලියම්ද සිල්වාට විකුණපු පන්විල දෙනියද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 571—572වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[ගාල්ල වි. ම. 1—1920.]

[හම්බන්තොට දැන්වීම නො. 7,528.]

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 23වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897තේ 1899යේ 1900යේ සහ 1903තේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට, පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ප්‍රෙඩරික් එවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ප්‍රෙඩරික් එවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

දකුනු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ මුල්කිරිගල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මුල් සිතියම 241.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 79B .. | දෙමටකැටියේහේන (පාරට ඉතුරුකර තිබෙන බිමකට්ටිය) .. .. | 0 0 34 |
| 79B1 .. | එම (එම) .. .. .. | 0 2 6 |
| | | 0 3 0 |

මීට මායිම්—උතුරට 263,563 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද, කහවත්තේ හිට වීරකැටියට යන පාරද; නැගෙණහිරට පාරක්ද; දකුණට වීරකැටියේ හිට කහවත්තට යන පාරද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු ආචාරිගේහේනද (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය); බස්නාහිරට 177,429, 271,643 පිඹුරුකඩදාසිවල පේන ඉඩම්ද.

II.—ලංකාමැනීමේ මුල් සිතියම 241.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 173A .. | කෝන්ගහකොරටුව (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) .. .. | 0 0 16 |

මීට මායිම්—උතුරට කහවත්තේ හිට වීරකැටියට යන පාරද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු කෝන්ගහකොරටුවද; නැගෙණහිරට 165,901 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; දකුණට 123,478 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද, වීරකැටිය හිට කහවත්තට යන පාරද; බස්නාහිරට කහවත්ත හිට වීරකැටියට යන පාරද, මෝදරවාන හිට එන පාරද, කහවත්ත හිට වීරකැටියට යන පාරද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 572—573වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[හම්බන්තොට වි. ම. 7—1920.]

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 30වෙනි සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ පෙනියන මීට යාකර තිබෙන ලැයිස්තුවේ සඳහන්වෙන ආණ්ඩුවේ ඉඩම්කට්ටිවල තණකොළ සහ කුරුඳු කපාගැනීමට 1920ක්වූ මැයි මස 1වෙනි දින පටන් අවුරුද්දක් බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ මෙහි සඳහන්කරණ කොන්දේසිවලට යටත්ව විකුණනු ලැබේ.

1. වැඩි ඉල්ළුම්කාරයා ගැනුම්කාරයාවේ.
2. බදු මිල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.
3. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ටවත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.
4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ කිසිම කොටසක තණකොට කැපීමේ බලය යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.
5. බදු ඉඩමේ වැටබඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකළොත් එසේ කිරීමට බදුකාරයා බැඳිලාය.
6. තණකොළ කන්ට ඉඩමේ අරින සෑම හරක්ම ප්‍රසිද්ධ පාරවල්වල දඩාවතේ නොයනාකාර දිගලිකර තිබන්ට ඕනෑය.
7. ගැණුම්කාරයා විසින් ඉඩම සුද්දෙන් සහ හොඳකාරයෙන් තිබාගන්ටත් නාගරික සභාවේ අණපණත් හැටියට ක්‍රියාකරන්ට ඕනෑය.
8. බදු ඉඩමෙන් බොරළු, වැලි ආදියක් විකුණන්ටවත් ගෙනයන්ටවත් ගැනුම්කාරයාට තහනම්ය. කවදා එම ඉඩමට අලාභහානිවෙන කිසි ක්‍රියාවක් කිරීමක් තහනම්ය.
9. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකළොත් සුමානයක් කල්දුන්විට එවෙනි ඉඩම හෝ ඉඩම් කොටස ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.
10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැණුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩමේ නැවත භුක්තියට පැමිණෙන්ට වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.
11. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ටත් ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

(අත්සන්කළේ), ජේ. ඩී. පිලිප්ස්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 19වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

1.—කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ පේන ඉඩම්වල ලැයිස්තුවයි.

| ඉඩම. | පිහිටීම. | තත්වය. | අ. රූ. ප. |
|---|---|---|---|
| 9 | වැලිකඩ .. | කුරුඳු සහ තණකොළ | 1 0 20·50 |
| 10 | එම ... | එම .. | 1 0 6 |

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් ගාලු දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්ෂ 1920ක්වූ මැයි මස 24වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ජේ. ඒ. ලෝරන්ස්,
දෙපිට පිස්කල් වම්භ.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 20වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

---

H. R. COTTLE, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.